චක්‍රලේඛ අංකඃ23 /2012

මගේ අංකඃඩබ/07/HIV/AIDS/2012,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09,
2012.08.13

සියළුම බන්ධනාගාර අධිකාරී
සහකාර බන්ධනාගාර අධිකාරීවරුන් වෙත,

**<u>බන්ධනාගාර තුල HIV/AIDS නිවාරණ වැඩ සටහන් වලදී උපයෝගී කර ගැනීමට DVD යන්ත්‍ර බෙදා දීම.</u>**

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු පුනරුත්ථාපන ක්‍රියාවලිය යටතේ බන්ධනාගාර ගත නේවාසික නේවාසිකාවන් සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලිංගාශ්‍රිත රෝග එඩ්ස් මර්දන වැඩ සටහනේ පූර්ණ අනුග්‍රහය මත ක්‍රියාත්මක කරනු ලබන HIV/AIDS නිවාරණ වැඩ සටහන සඳහා තෝරාගත් බන්ධනාගාර නිලධාරීන් වෙනුවෙන් නිවාරණ ක්‍රියාකාරකම් සහ පුහුණු වැඩ සටහන් දැනටමත් සාර්ථකව අවසන් කර ඇත.

02. එම පුහුණුව ලැබූ නිලධාරීන් විසින් බන්ධනාගාර ආයතන වල තෝරාගත් නේවාසික සහචර නායක කණ්ඩායම් ද පුහුණු කර අවසන් කර ඇත. එකී පුහුණුවට අදාලව ඉහත වැඩ සටහන මගින් ලබා දී ඇති ඩී.වී.ඩී තැටි, කෙටි චිත්‍රපට හා නේවාසිකයින් වෙනුවෙන්ම නිෂ්පාදිත වීඩියෝ නාට්‍ය සියළුම නේවාසිකයින් සඳහා පෙන්වීමට අඩු පාඩුවක්ව පැවති ඩී.වී.ඩී.යන්ත්‍ර පහසුකම් පහත සඳහන් පරිදි බෙදාදීමට සූදානම් කර ඇත. එ අනුව ඔබ ආයතනයට වෙන්කර ඇති ඩී.වී.ඩී යන්ත්‍ර නොපමාව බන්ධනාගාර මූලස්ථාන ගබඩාවෙන් භාරගෙන ඔබ ආයතනයේ බඩු වට්ටෝරු පොතෙහි ලේඛණ ගතකර උප ලේඛණයකින් සිරකරු සුභ සාධක අංශයට නිකුත් කිරීමට කටයුතු කරන ලෙස දන්වමි.

03. ඔබ ආයතනයේ සියළුම සුභ සාධක නිලධාරීන්ට හා තෝරා ගත් ජේලර්වරුන්ට පුහුණු සැසිවලදී ලබා දී ඇති ඩී.වී.ඩී පට, කෙටි චිත්‍රපට හා උගත්දේ සහචර නායකයින් ද සම්බන්ධ කරගෙන කාල සටහනකට අනුව සියළුම නේවාසිකයින්ට හා දෛනිකව ඇතුලත් වන නවක නේවාසිකයින් සඳහා ප්‍රදර්ශණය කරවීමට කටයුතු කරන ලෙසට සුභ සාධක නිලධාරීන්ට උපදෙස් දෙන්න. තවද මින් ඉදිරියට මෙම වැඩසටහන් පැවැත්වීම පිළිබඳ වාර්ථාවක් සෑම මසකට වරක්, එලඹෙන ඊලග මස 10 වනි දිනට පෙර බන්ධනාගාර කොමසාරිස් (සුභ සාධක) වෙත එවීමට වගබලාගතයුතු අතර මෙහි සියළු අධීක්ෂණ කටයුතු සඳහා ඔබව පත් කරමි.

| | | | | | |
|---|---|---|---|---|---|
| 01. වැලිකඩ | ඩී.වී.ඩී යන්ත්‍ර | 02 | 16. වීරවිල | ඩී.වී.ඩී යන්ත්‍ර | 01 |
| 02. (වැලිකඩ කාන්තා අංශය) | | | 17. පල්ලේකැලේ | එම | 01 |
| 03. මහර | ඩී.වී.ඩී යන්ත්‍ර | 01 | 18. තල්දෙන | එම | 01 |
| 04. බෝගම්බර රිමාන් | එම | 01 | 19. වාරියපොළ | එම | 01 |
| 05. මැගසින් | එම | 01 | 20. අනුරාධපුර | එම | 01 |
| 06. කොළඹ රිමාන්ඩ් | එම | 01 | 21. බදුල්ල | එම | 01 |
| 07. බෝගම්බර | එම | 01 | 22. පොළොන්නරුව | එම | 01 |
| 08. වටරැක | එම | 01 | 23. මොනරාගල | එම | 01 |
| 09. මීගමුව | එම | 01 | 24. කුරුවිට | එම | 01 |
| 10. පල්ලන්සේන | එම | 01 | 25. කෑගල්ල | එම | 01 |
| 11. කළුතර | එම | 01 | 26. අඹේපුස්ස | එම | 01 |
| 12. ගාල්ල | එම | 01 | 27. යාපනය | එම | 01 |
| 13. බූස්ස | එම | 01 | 28. මඩකලපුව | එම | 01 |
| 14. මාතර | එම | 01 | 29. ත්‍රිකුණාමලය | එම | 01 |
| 15. තංගල්ල | එම | 01 | 30. කදුරුගස්ආර | එම | 01 |

ජී.ඩබ්ලිව්.කොඩිප්පිලි,
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.